

# සිනුවර හසුන

*සිඩ්නි සිට ලියමි*

තමන් ඉපදුණු රට අත හැර, ක්ෂිතිජය තරණය කොට, නුහුරු නුපුරුදු දේශයක අළුතින් ජීවිතයක් ගත කිරීමට ගන්නා වූ තීරණය ඉතා අසීරු, අවදානම් සහිත සහ එනිසාම ඉතාමත් එඩිතර වූ එකක් වේ.

ලිඛිත සහ පරම්පරාගත ඉතිහාසය අනුව සිංහල අපි සියළු දෙනා කෙදිනක හෝ ක්ෂිතිජය තරණය කළවුන් ට නෑකම් කියන්නෝ වෙමු. වසර දෙදහස් පන්සිය පනහකට පමණ පෙර දිනක සිදු වූවා යැයි සැලකෙන විජයාගමනයෙන් සහ ඉන් පෙර හා පසු මෑත අතීතය දක්වා ම විවිධ කාල වකවානුවල, විවිධාකාරයෙන් ක්ෂිතිජය තරණය කළ අපේ මුතුන් මිත්තන්ගෙන් පැවතෙන පිරිසෙන් අද සිංහල යැයි හැඳින්වෙන අප ජන කොටස සෑදී ඇත.

සිංහල බස දෙඩන්නෝ, සිංහල බස ලියන්නෝ, සිංහල බස අසන්නෝ, සිංහල බසෙන් සන්නිවේදනය කරන්නෝ, සිංහල සංස්කෘතියේ හරය මත තම ජීවිතය ගෙවන්නෝ සිංහලයෝ වෙති.

විවිධ කාල වකවානුවල ක්ෂිතිජය තරණය කර ලක්දිවට පැමිණියෝ මේ ආකාරයේ අනුවර්තනයකින් සිංහලයන් වූ බව නොරහසකි.

මෙලෙසින්ම ක්ෂිතිජය තරණය කිරීමේ තීරණය ගෙන අද ඕස්ට්‍රේලියාවේ විවිධ නගරවල ජීවත්වෙන බාල, තරුණ, වැඩිහිටි සිංහල පිරිස බොහෝ ය. මෙය එක් දිනයකින් ඇතිවූ තත්වයක් නොවේ. දශක දෙකක පමණ කාලයක් තිස්සේ පැවති සංක්‍රමණ ක්‍රියාදාමයක ප්‍රතිඵලයකි.

ක්‍රම ක්‍රමයෙන් සිංහල පිරිස වැඩිවී අද මෙල්බර්න් සහ සිඩ්නි වැනි නගර වල ලාංකික කඩ හරහා, ලාංකික බොදුන් හල් හරහා, සිංහල බුද්ධාගමේ පන්සල් හරහා, සන්නස වැනි පුවත්පත් හරහා, සති අන්තවල පැවැත්වෙන කලා සංදර්ශන දර්ශන හරහා, සිංහල උප සංස්කෘතියක් ඇතිවෙමින් පවතී.

පසුගිය මාසයේ මගේ මුල් කොලමින් සඳහන් කළාක් මෙන් අද සිනුවර නිරතුරුවම සිංහල කලා කටයුතු සිදු කෙරේ. නමුත් මින් දශක දෙකකට පමණ පෙර කාලය මෙයට හාත්පසින්ම වෙනස් එකක්ව තිබී ඇත.

සිනුවර වෙසෙන වියතෙකු වන ආචාර්ය දෙන් උබයසිරි වික්‍රම වරෙක ලියා සඳහන් කළ පරිදි 1990 පමණ වූ මෑත කාලය ද සිංහලයන් දෙදෙනෙක් අතරමග දී හමු වූ විටෙක සිංහලෙන් එකිනෙකා ඇමතීම මදිකමක් යයි සිතූ සමයෙක් විය. මෙල්බර්න් නුවරට පැමිණෙන වික්ටර් රත්නායක ගේ "ස" ප්‍රසංගය සිනුවර සංවිධානය කිරීමට හැකිකමක් සහ අවශ්‍යතාවයක් තිබූ සිංහල සංවිධානයක් එවකට මෙහි නාමිකව හෝ නොතිබුනි. මේ අඩුව පුරවා ගෙන සිනුවරට ශ්‍රී ලංකාවෙන් පැමිණ සිටි සිංහල සම්භවයකින් යුත් අපේ අයට අපේකම යන සංකල්පය හඳුන්වා දී, ඔවුන් තුල එය පෝෂණය කොට වර්ධනය කිරීමේ අවංක චේතනාවෙන්, සිංහල සංස්කෘතික සාරධර්මයනට හිතැති පිරිසක් එකතුව 1990 දී සිංහල සංස්කෘතික හමුව පිහිටවූහ.

සිංහල සංස්කෘතික හමුවේ ආරම්භක සභාපතිවරයා වූ යේ පසුකලෙක අන්තර්ජාතික සම්මාන ලබා කීර්තියට පත් සිනමාකරු සෝමරත්න දිසානායකය.

විවිධත්වය තුල ඒකීයත්වය (යුනිටි ඉන් ඩයිවර්සිටි) යන ඕස්ට්‍රෙලියානු බහු සංස්කෘතික සංකල්පයට අනුව යමින්, නිව් සවුත් වේල්සයේ ජීවත්වන, සිංහල සම්භවයකින් යුතු හෝ සිංහල හැදියාව අගයන හෝ බාල-යොවුන්-තරුණ-වැඩිහිටි පරපුරට සිංහල සංස්කෘතික ලක්ෂණ හඳුන්වාදීමට විවිධ වැඩ සටහන් සංවිධානය කොට, අප ප්‍රජාවේ පිරිස අතර අපේකම අවදිකරලීමට සිංහල සංස්කෘතික හමුව ප්‍රතිඥා දී ඇප කැප වූහ.

සිංහල භාෂා පාසැල් පවත්වමින්, සිංහල සංස්කෘතික සංදර්ශන වේදිකා ගත කරමින්, සිංහල සාහිත්‍යමය නිර්මාණ එළි දක්වමින්, සිංහල සංස්කෘතික හමුව අද ද එම කාර්ය භාරය කරගෙන යති.

ගතවූ සැප්තැම්බර් මාසය තුල සෝමරත්න දිසානායක ගේ සිරි රජ සිරි සිනමා සිත්තමත්, සංස්කෘතික හමුවේ ජීව නාලිය වන සිංහල පාසැල් සිසු දරු දැරියන් ගේ ද්වි වාර්ෂික "මල් කැකුළු" විවිධ ප්‍රසංගයත් නැරඹීමට ලැබීම සිනුවර ආරච්චිල ලැබූ නෙත් තෙත් කරවන අත්දැකීම් දෙකක් විය.

සුන්දර රිවි දිනයේ, පින්බර හිමිදිරියේ සිංහල උගෙනට පැරමටා, මින්ටෝ සහ බ්ලැක්ටවුන් සිංහල පාසැල් වෙතට යන අපේ පෙම්බර දූ දරුවන් උදෑසන පිපුණු මල් කැකුළු වැනිය. මාපිය සිත් සනසමින්, ගුරු උපදෙස් පිළිපදිමින්, ඔව්හූ සිංහල බස ලියති. සිංහල බස දෙඩති. සිංහල බස උගනිති. සිංහල කම රකිති.

ඒ පිපුණු මල් කැකුළු සුවඳ දසත විහිදේවා!

සිනුවර තොරතුරු රැගත් "සිනුවර හසුන" සමග ලබන මාසයේ නැවත හමුවෙමු.

*සිනුවර ආරච්චිල*
<sinuwara.arachchila@gmail.com>




# හැමදාමත් රැවටෙන අපේ මිනිස්සු

අපේ රටේ ජනතාව ගැන මට නම් දැන් ඇත්තෙ දුකටත් ශෝකයටත් වඩා තරමක කෝපයකි. ඒ මනුෂ්‍යයාගේ මොළය කොතරම් දියුණු වුවත් අපේ රටේ මනුෂ්‍යයන්ගෙ මොළය ආපස්සට යන නිසාය. ජාතියේ ආරම්භයේම සිටම රැවටෙන ජාතියක් වූ අපි තවමත් රැවටෙමු. එකල විදේශිකයන්ට රැවටුන අපි මෙකළ විදේශිකටන්ට වක්‍රවද, රටේම පාදඩයන්ට සෘජුවම රැවටෙති. විජයගෙන් පසු අප නානාප්‍රකාර එවුන්ට රැවටී ඇත. පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ආදී එකී නොකී මෙකී හැම දෙනාටම රැවටී සිටි අපි ඊ ළඟට රැවටුනේ අපේ රටේ දේශපාලකයන්ටය. නානා ප්‍රකාර ඡන්ද පොරොන්දු වලට රැවටී එහාට මෙහාට ආණ්ඩු වෙනස් කරමින් රටම ආපස්සට යැවූ අප ජනතාවගෙන් කොටසක් මෑතකදී රැවටුනේ සක්විති නැමැති ඉංග්‍රීසි වෙළෙන්දාටය. උගත් නූගත් බේදයකින් තොරව, විද්වතුන්ද, රජයේ ඉහළ නිලධාරීන්ද ඔහුගේ මායාකාරී වලට වැටුනේ ඇස් ඇරගෙනය.

මහ දවල් බැංකු මංකොල්ල කන ලෝකයක රුපියල් කෝටි දාහක් පමණ මංකොල්ලා කාගත් සක්විති නැමැති මේ අන්වර්ථ කූට ඉංග්‍රීසි වෙළෙන්දා මුදල් මංකොල්ල කාගත්තේ අපි ආයුධ අතේ ඇතිව නොවේ. ඒ උප්පතියෙන්ම ලබා ගත් කපටි මොළයෙනි.

"මම ඉගැන්වීමට උපන්නෙමි" ඉරිදා පුවත්පත කියවන ඔබ සැම කාටත් මෙම වෙළඳ දැන්වීම මතක ඇතිවාට කිසිම සැකයක් නැත. මෙම වෙළඳ දැන්වීම හරහා විශාල ජනතාවක් මුලා කල සක්විති කාගේත් කනින් රිංගා පිටරටකට පැන ගත්තේ මහ බැංකුවේ සක්විතිලාගේ ඇස්වලටද වැලි ගසාය. රටින් පැන යාමට පෙර ඉතා සූක්ෂම ලෙස පිටරටවල ගිණුම්වලට මුදල් බැර කරගත් ඔහු තමන් ළඟ සේවය කළ අසරණ සේවකයන්ද බිල්ලට දෙමින් කර ඇති මගඩිය අහස පොළව නුහුලන අපරාධයකි.

සක්විති රණසිංහ ඉංග්‍රීසි සර් යන නාමය මුලට දමා ගනිමින් තැන් තැන්වල කුඩා ඉංග්‍රීසි පන්ති පවත්වමින් ජීවත්වූ රණසිංහ ගුරුවරයාගේ දෙවෙනි උප්පත්තිය ලබන්නේ මහා පරිමාණයේ ඉංග්‍රීසි පන්ති, දේශපාලයන් හා මුදල් සමාගම් හරහාය. සිත් ඇද ගන්නා සුළු වාග් විලාශය හා පෞරුෂය තුලින් තරුණ පරපුර මෙන්ම වැඩිහිටි පරම්පරාවද රැවටීමට ඔහුට වැඩි කාලයක් ගත වූයේ නැත. මුළු රට පුරාම ඉංග්‍රීසි පන්ති ක්‍රියාත්මක කරමින් පෞද්ගලික ඉංග්‍රීසි පන්ති ව්‍යාප්ත කරමින් පෞද්ගලික ඉංග්‍රීසි පන්ති ආරම්භ කළ ඔහු ඒ සඳහා තෝරා ගත්තේ එසේ මෙසේ පුද්ගලයෙකු නොවේ. රටම පිළිගත් දක්ෂ විද්වතෙක් වන එඩ්වින් ආරියදාස මහතාය. ඒ රුපියල් ලක්ෂයක වැටුපක්, මෝටර් රියක්, ඉන්ධන හා වෙනත් පහසුකම් සමගිනි. එඩ්වින් ආරියදාස රැවටීමට තරම් සූක්ෂම මොළයක් තිබූ සක්විති ට සාමාන්‍ය මිනිසුන් රැවටීමට එතරම් කාලයක් ගතවූයේ නැත.




**කෙතරම් බණ දේශනා ඇසුවත් සදාකාලික රැවටිල්ලකට අසුවී ඇති ජනයා හැමදාමත් දුකේ ඇලී ගැලී ඇත. එහෙත් ඔවුන් වෙනුවෙන් ජාතක කථා පොතේ එන පූචි මන්ද ජාතකය ගැන නොකියාම බැරිය. එයින්, සොරුන්ට අසුවීමට පෙර ඔවුන්ගේ ගැලවෙන්නේ කෙසේ ද යන ප්‍රඥාවන්ත පණිවිඩයක් ජනතාවට ලබා දී ඇත. සැක කල යුත්තා සැක කිරීමෙන් හා පාපීන් ඈත් කිරීමෙන් කෙනෙකුට මෙලොව ආරක්ෂාව ලැබෙන බව හොඳින් පැහැදිලි කර ඇති මෙම පූචිමන්ද ජාතකය එහි අන්තර්ගතය, මහ මඟ සිටින දුගී වෙළෙන්දාගේ සිට එඩ්වින් ආරියදාස මහතා දක්වාම පොදු කාරණයක් බව කදිමට සනාථ කර ඇත.**

සක්විති ගැහිල්ල කෙසේද කියතොත් ඔහුට අපේ රටේ ඉහළ දේශපාලඥයන්, කලාකරුවන්, හමුදා නිළධාරීන්, පරිපාලන නිළධාරීන් මෙන්ම මහ මඟ වෙළඳාම් කරන වෙළෙන්දන් හා අසරණ පීඩිත දුගී මිනිසුන්ද අසු වී ඇත. මිරිහාන පොලීසියේ පැමිණිලි පොතට ගලා ආ පැමිණිලි තොග ය අනුව ඒ වෙනුවෙන් වෙනම ඒකකයක් ද පිහිටවිණි. තවත් කෝටි ගණන් මුදල් තැම්පත් කල දේශපාලඥයන් හා ව්‍යාපාරිකයන් පැමිණිලි නොකර දත්මිටි කාගෙන ඉන්නේ තමන්ගේ ආදායම් පිළිබඳව ආදායම් බදු දෙපාර්තමේන්තුව දැනගනීවි යන බියෙනි. ආදායම් බදුවලට අසුවනවාට වඩා සක්විතිට අසුවීම යහපත් යැයි සිතා එතුමාලා නිහඬව කඳුලු සලයි.

අබාධිත රණ විරුවන්ගේ තැම්පත් මුදල්, ගෙවල් දොරවල් විකුණා පොලිසියෙන් යහපත් අනාගතයක් ගොඩනගා ගන්නට සිතූ මිනිසුන්ගේ මුදල් පදික වීදියේ වෙළඳාම් කරමින් සිටි එදිනෙදා ජීවිතය තල්ලු කරන අහිංසක මිනිසුන්ගේ මුදල් සොරාගෙන සක්විති කර ඇති පාපයට ඔහුට වන්දි ගෙවීමට ඇති හැකියාව තවමත් ශූන්‍ය තාවයේ පවතින අතර ඔහු සොයා ගත හැක්කේද සක්විති රජවරුන්ගේ පිහිටෙන් පමණි. මේ අතරින් ඇසට කඳුලක් නංවන සිද්ධිය වන්නේ, තමන්ගේ ගෙවල් දොරවල් විකුණා කුලියට නිවසක් ගෙන දරුවන්ට ඉගැන්වීමට ලක්ෂ 35 මුදලක් සක්විති ළඟ තැන්පත් කල අන්ධ පියෙකුගේ කථාවයි. අද ඔවුන්ට ඉන්න හිටින්න ද තැනැක් නැත.

අපේ රටේ මීට පෙරද මෙවැනිම පෞද්ගලික මුදල් සමාගම් බංකොලොත් වී අයිතිකාරයන් රජයේද ඇස්වසා රටින් පැනගිය අවස්ථා බොහෝය. ඒත් මේවාට වැට බඳින්නට අපේ රටේ නීතික්‍රම අළුත්වැඩියා කිරීමට බැරි ඇයි? සියයට දෙක තුනක වැඩි පොලියට හා වාසියට රැවටෙන අහිංසක මිනිස්සු සක්විතිලාට රැවටෙන්නේ සේරිවාණිජ ජාතකයටද විහිළු කරමිනි.

ප්‍රභූ දේශපාලන ඇසුරක් ලබා ඇති සක්විති කැසිනෝ සූදු කාරයෙකි. සල්ලාලයෙකි. ඔහු එක් රැයකට කෝටි දෙක තුනක් කැසිනෝ සූදුව වෙනුවෙන් වියදම් කර ඇත. එඩ්වින් ආරියදාස මහතා යහපත් පුද්ගලයෙකි. ඔහු හොරෙක් නොවේ. නමුත් සක්විතිගේ මෙම ක්‍රියාකාරකම් මද වශයෙන් හෝ දැනගත් ඔහුට මොහු පිළිබඳව සැකයක් පහළ නොවීම පුදුමයකි. මන්ද බොහෝ පුද්ගලයන් මුදල් තැම්පත් කිරීමට ප්‍රථම ඔහු පිළිබඳව විමසා ඇත්තේ එඩ්වින් ආරියදාස මහතාගෙනි. "බය නැතුව තැන්පත් කරන්න. විශ්වාසවන්ත මිනිහා." යන සහතිකය ඔහු ලබා ගත්තේ ආරියදාස මහතාගෙනි.

සක්විති වැනි මිනිස්සු එදත් ජීවත් වුනෝය. අදත් ජීවත් වෙති. අනාගතයේත් පහළවෙයි. රැවටීමත් මුලාවත් එකසේමය. ලෝකයේ වැඩියෙන්ම රැවටෙන මිනිසුන් සිටින රට ලංකාව යැයි යන නාමය ගිනස් පොතට ඇතුලත් වූයේ එය පුදුමයට කාරණයක්ද නොවේ. බුදුන්ගේ කාලයේ සිටම එන මෙවැනි හොරු ගැන බුදුන් තම ගිහි පැවිදි ජනයා වෙනුවෙන් බණ දේශනා කර ඇත. කෙතරම් බණ දේශනා ඇසුවත් සදාකාලික රැවටිල්ලකට අසුවී ඇති ජනයා හැමදාමත් දුකේ ඇලී ගැලී ඇත. එහෙත් ඔවුන් වෙනුවෙන් ජාතක කථා පොතේ එන පූචි මන්ද ජාතකය ගැන නොකියාම බැරිය. එයින්, සොරුන්ට අසුවීමට පෙර ඔවුන්ගේ ගැලවෙන්නේ කෙසේ ද යන ප්‍රඥාවන්ත පණිවිඩයක් ජනතාවට ලබා දී ඇත. සැක කල යුත්තා සැක කිරීමෙන් හා පාපීන් ඈත් කිරීමෙන් කෙනෙකුට මෙලොව ආරක්ෂාව ලැබෙන බව හොඳින් පැහැදිලි කර ඇති මෙම පූචිමන්ද ජාතකය එහි අන්තර්ගතය, මහ මඟ සිටින දුගී වෙළෙන්දාගේ සිට එඩ්වින් ආරියදාස මහතා දක්වාම පොදු කාරණයක් බව කදිමට සනාථ කර ඇත.

ලක්ෂමන් කොඩිතුවක්කු